## අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව

## හම්බන්තොට දිස්ත්‍රික්කය
--------------------------

**1 මූල්‍ය ප්‍රකාශන**
----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 13 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 15 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් 30 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය**
------

මෙම වාර්තාවේ **1.3.2, 1.3.3** හා **1.3.6**යන ඡේදවල දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
--------------------------------------

**1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**
------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**
----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය සහ සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු.1,485,994 ක් වූ පොලී ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සභාවට අයත් පිරිවැය රු. 625,000 ක් වූ මෝටර් රථය, දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයට අයත් පිරිවැය රු. 100,000 ක ජීප් රථය සමඟ හුවමාරු කරගෙන තිබුණු නමුත්, අදාළ ගැළපීම් කර ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව සතු ඉඩම් 3 ක සහ සුසාන භූමි 18 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළදී ස්ථාවර වත්කම් වෙනුවෙන් දරා තිබුණු එකතුව රු.2,010,999 ක් වූ වියදම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයට අදාළ එකතුව රු. 1,164,081 ක් වූ ආදායම් ආධාර, කුලී මුදල්, බලපත්‍ර ගාස්තු හා පරිපාලන වියදම් සඳහා ලැබීම්, සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ඉදිරි වර්ෂය සඳහා රථ වාහන හා මාර්ගස්ථ මුදල් රක්ෂණය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු එකතුව රු. 228,087 ක වියදම වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**1.3.3 නොසැසඳූ පාලන ගිණුම්**

---------------------------

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් 09 ක ශේෂයන් සහ ඊට අදාළ පොත්පත් හා උපලේඛන වල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු. 3,488,847 ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

**1.3.4 ලැබිය යුතු ගිණුම්**

--------------------

(අ) මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු. 1,081,369 ක් වූ නොපියවූ අත්තිකාරම් ශේෂ 29 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

(ආ) "දොරින් දොරට ගමින් ගමට"වැඩසටහන යටතේ ඉකුත් වර්ෂයේදී ඉටුකළ කර්මාන්ත වෙනුවෙන් රු. 1,601,093 ක ප්‍රාග්ධන ආධාර සහ මෝටර් ග්‍රේඩර් කුලියට දීම වෙනුවෙන් රු. 161,483 ක ආදායම් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතුව පැවතුණි.

**1.3.5 ගෙවිය යුතු ගිණුම්**

-------------------

(අ) ඉකුත් වර්ෂයට අදාළ රු. 1,601,093 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂ සහ ඉකුත් වර්ෂවලට අදාළව පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු. 435,506 ක් වූ දායක ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂය සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවිය යුතු, එකතුව රු. 407,436 ක මාසික වාරික 2 ක් සහ සමාලෝචිත වර්ෂයට අදාළ රු. 2,444,618 ක් වූ වාරික මුදල් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

**1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

එකතුව රු. 67,215,732 ක් වූ ගොඩනැගිලි සම්බන්ධයෙන් පිළියෙල කළ ස්ථාවර වත්කම් ලේඛනයද, රු.16,685,214 ක් වූ දේශීය ණය සංවර්ධන අරමුදලේ ශේෂ සනාථද, එකතුව රු. 4,494,130 ක් වූ ඉඩම් 12 ක වටිනාකම සම්බන්ධයෙන් හිමිකම් ඔප්පු/පැවරුම් නියෝගද, එකතුව රු. 850,773 ක් වූ රැඳවුම් තැන්පත් සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛනයද, එකතුව රු. 133,000 ක් වූ නීතිඥ ගාස්තු ගෙවීම තහවුරු කරන සාක්ෂි යනාදී තොරතුරු ඉදිරිපත් නොකෙරුණු බැවින් විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 1.3.7 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2015 මැයි 21 දිනැති අංක 15/ විවිධ (051) දරන අමාත්‍ය මණ්ඩල තීරණය | යොමුගත අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූල නොවී හම්බන්තොට දිස්ත්‍රික්කයේ පළාත් පාලන ක්‍රීඩා උත්සවය වෙනුවෙන් සභා අරමුදලින් රු. 159,405 ක වියදම් දරා තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි571 (3) | 1993 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළ එකතුව රු. 2,950,915 ක කල් ඉකුත් වූ තැන්පත් ශේෂ 212 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 2,907,705 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා අඩු වූ ආදායම රු. 1,533,118 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 4,440,823 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේදී මෙන්ම, සමාලෝචිත වර්ෂයේදී සභාවේ ස්වයං උත්පාදන ආදායම් ප්‍රමාණය මෙන් දෙගුණයක් ඉක්මවා පුනරාවර්තන වියදම්වල වැඩිවීමක් පැවතුණි.

(ආ) ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ආදායම් වලින් කිසිදු ආකාරයකින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට නොහැකි බවත්, එය සමාලෝචිත වර්ෂයේදී මෙන්ම ඉකුත් වර්ෂ වලදීද තහවුරුවී ඇති බවත් පෙන්නුම් කෙරුණි.

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 වරිපනම් බදු**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාරව වරිපනම් බදු තක්සේරු කර අයකිරීම සඳහා සභාව විසින් සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

**2.3.2 බදුකුලී**

සභාවට අයත් ගොඩනැගිලි හා යන්ත්‍රෝපකරණ කුලියට දීම වෙනුවෙන් අයවිය යුතු රු. 219,866 ක මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.3.3 බලපත්‍ර ගාස්තු**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 149,150,151 හා 152 යන වගන්ති ප්‍රකාරව සභාව විසින් නියමිත පරිදි වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර නොගැනීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට රු. 253,730 ක හිඟ ශේෂයක් පැවතුණි.

**2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු. 462,748 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු. 1,227,963 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධන ඇගයීම**

සභා බල ප්‍රදේශයේ මාර්ග ඉදිකිරීම් කටයුතු සඳහා සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය මගින් රු.2,100,000 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණු නමුත්, අදාළ කාර්යයන් සඳහා එම ප්‍රතිපාදන ප්‍රයෝජනයට නොගැනීම නිසා වර්ෂය අවසානයට සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

ජංගම පුස්තකාල බස් රථයක් ලබා ගැනීම පිණිස අනුග්‍රාහකත්වයක් ලෙස ජාතික ලොතරැයි මණ්ඩලයෙන් ලබා දී තිබුණු රු.100,000 ක මුදල එම කාර්යය සඳහා යොදවා නොගෙන සේවක කාර්යසාධන ඇගැයීම් උත්සවයක් පැවැත්වීම සඳහා වියදම් කර තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**--------------------------**

සමාලෝචිත වර්ෂයේදී කාර්යාලය ඉදිරිපස වැට සකස් කිරීමේ හා සභා භූමියේ වාහන නතර කිරීමේ ස්ථානයක් ඉදිකිරීමට අදාළ කර්මාන්ත පිළිබඳ පරීක්ෂාවේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 ඡේදය අනුව ස්වේච්ඡා සංවිධාන සඳහා ඉදිකිරීම් වැඩ පමණක් පැවරිය හැකි වුවද, ඊට අනුකූල නොවී විශේෂිත කාර්යයක් වන සුදු යකඩ ගේට්ටුවක් සහ තාප්පය උඩින් සුදු යකඩ වැටක් සකස් කිරීම සඳහා එකතුව රු. 1,068,772 ක වියදම් දරා තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6 ඡේදය අනුව කොන්ත්‍රාත්කරුවෙකුට ගෙවිය යුතු සෑම ගෙවීමකින්ම නිශ්චිත මුදලක්, රඳවා තබාගත යුතු වුවත්, ඊට අනුකූල නොවී ඉහත කර්මාන්ත වෙනුවෙන් පිළිවෙලින් රු. 1,600,000 ක් හා රු. 600,000 ක් ලෙස සම්පූර්ණ මුදලම ගෙවා තිබුණි.

**3.4 බලය නොලත් ගනුදෙනු**

--------------------------

**පුරහල විවෘත කිරීමේ උත්සවය සඳහා වියදම් දැරීම**

**---------------------------------------------------**

ප්‍රාදේශීය සභා අන්තර් ගම්මාන සංවර්ධනය සඳහා වූ මෙහෙයුම් අත්පොතෙහි 4.15 ඡේදයට අනුව පරිපාලන වියදම් සඳහා වූ මුදලින් උත්සව වියදම් නොදැරිය යුතු වුවත්, විධිමත් අනුමැතියක් ලබා නොගෙන පුරහල විවෘත කිරීමේ උත්සවය සඳහා සමාලෝචිත වර්ෂයේදී පරිපාලන වියදම් වලින් රු. 347,000 ක වියදම් දරා තිබුණි.

**3.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

**----------------------------**

සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරු 06 ක පුරප්පාඩු 06 ක් පැවතුණු අතර, තවත් තනතුරු 06 ක අතිරික්ත සේවක සංඛ්‍යාව 10 ක් විය. පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට සහ අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කටයුතු කර නොතිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**--------------------------------------**

**4.1 අයවැය පාලනය**

**------------------**

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 24 ක් සඳහා සලසා තිබුණු රු.53,866,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදන ඉතිරි කිරීමද, තවත් වියදම් විෂයයන් 05 ක එකතුව රු.29,178,534 ක් වූ ඉතිරි කිරීමද, වෙනත් වියදම් විෂයයන් 03 ක අයවැයගත සීමාව ඉක්මවා රු.2,781,456 ක වියදම් දැරීමද, ආදායම් විෂයයන් 02 ක ළඟා කර නොගත් ඉලක්කගත ආදායම් රු.25,874,241 ක් පැවැතීම යන හේතු නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 4.2 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 වත්කම් කළමනාකරණය

**නිෂ්ක්‍රීය වත්කම්**

අලුත්වැඩියා කර භාවිත කළ හැකි තත්ත්වයේ පවතින රොකී ජීප් රථය හා ත්‍රීරෝද රථය 2014 වර්ෂයේ සිටද රු. 52,400 ක වියදමින් 2013 වර්ෂයේදී මිලදී ගෙන තිබූ ප්‍රින්ටරය එදින සිටද නිෂ්ක්‍රීයව පැවතුණි.

## 4.4 බේරුම් නොකළ බැරකම්

සමාලෝචිත වර්ෂයේ අවසානයට සභාවේ බේරුම් නොකළ බැරකම් වල මුළු එකතුව රු. 4,617,459 ක් වූ අතර, ඉන් රු. 2,040,099 ක් වූ බැරකම් ඉකුත් වර්ෂවලට අදාළ ඒවා වුවද, එකී ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) වත්කම් කළමනාකරණය